# බයෝපති වෛද්‍ය ක්‍රමය

ලෝකයේ දිනපතා නව වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම බිහිවෙනවා. එම ප්‍රතිකාරක්‍රම වල ඇති සාර්ථක අසාර්ථක බව අනුව එය ජනතාව අතර ප්‍රචලිතවීම නොවීම සිදුවෙනවා. අප රට තුළද නොයෙකුත් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම පවතිනවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, බටහිර වෛද්‍ය ක්‍රමය ඉන් ප්‍රධාන තැනක් ගන්නා අතර ඊට අමතරව හෝමියෝපති වෛද්‍ය ක්‍රමය, ඇලෝපති වෛද්‍ය ක්‍රමය ආදී ප්‍රතිකාර ක්‍රමද පවතිනවා. මෙම වෛද්‍ය ක්‍රම අතරට බයෝපති වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමය (Biopathy theory) නමින් අලුත් වෛද්‍ය ක්‍රමයක්ද එක්වී තිබෙනවා.

ජපානයේ ගිෆෝ ප්‍රදේශයේ ඉතා ප්‍රචලිත වෛද්‍ය ක්‍රමයක් වන මෙය මහාචාර්ය අකිරා ඔසැතෝ මහතා යටතේ පවත්වාගෙන යනු ලැබේ.

උත්පත්තියෙන් ඇතිවන ජානමය රෝග හැර අනෙකුත් සෑම රෝගයක්ම බයෝපති ප්‍රතිකාර ක්‍රමය මගින් සුවකළ හැකි බව මෙම ප්‍රතිකාර ක්‍රමයේ නිරත වෛද්‍යවරයා පවසති.

ශ්‍රී ලංකාවේ මෙම ප්‍රතිකාර ක්‍රමය පවත්වාගෙන යනු ලබන්නේ බයෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ උපදේශක ඇලන්ටන් වීරසිංහ මහතාය. හෙතෙම ජපානයේ බයෝපති වෛද්‍ය පීඨයේ ඒ සඳහා සහතිකය ලබා ඇත. මෙලෙස එවන් සහතිකයක් ලබා ඇති පළමු විදේශිකයා වන වීරසිංහ මහතා සිය ප්‍රතිකාර ක්‍රමය ගැන පවසන්නේ මෙලෙසයි.

බයෝපති ක්‍රමය තුළින් සිදුකරන්නේ කිසියම් පුද්ගලයකු තුළ පවතින රෝගයක් මූලික කරගෙන ප්‍රතිකාර කිරීම නෙමෙයි. එම රෝගය ඇතිවීමට හේතුවූ සියලුම කරුණු ඉලක්ක කරගත ප්‍රතිකාර කිරීමයි. එසේම අප ප්‍රතිකාර වශයෙන් ලබාදෙන්නේ ඖෂධ නොවෙයි. ස්වාභාවික ශාක වලින් නිෂ්පාදනය කළ පෝෂණ ද්‍රව්‍යයකි. එහි සිරුරට අත්‍යාවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය අඩංගුව තිබෙනවා. එනිසා අප ලබාදෙන ප්‍රතිකාර ද්‍රව්‍ය සිරුරට කිසිසේත්ම හානිකර නැහැ. ඕනෑම වයස් කාණ්ඩයක සිටින ඕනෑම ශරීර සෞඛ්‍ය මට්ටමක සිටින අයකුට මෙම ප්‍රතිකාර ද්‍රව්‍ය භාවිතා කළ හැකියි.

බයෝපති ක්‍රමය තුළින් ප්‍රතිකාර කිරීමේදී රෝගියාව පරීක්ෂා කරීම සඳහා පරීක්ෂණ වාර්තා ලබා නොගන්නා බව පවසන වීරසිංහ මහතා ඒ සඳහා අවධානය යොමු කරන්නේ රෝගියාගේ ප්‍රතිශක්තිකරණ ශක්තිය පිළිබඳව පමණක් බව සඳහන් කරයි. ඒ අනුව ලබාදිය යුතු ප්‍රතිකාර ද්‍රව්‍ය මාත්‍රාව තීරණය කරන අතර බටහිර සහ දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සුව කළ නොහැකියැයි පවසන නොයෙකුත් රෝග සිය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමය මගින් සුව කර තිබෙන බවද හෙතෙම පවසයි.

බයෝපති වෛද්‍ය ක්‍රමය මගින් ලබාදෙන ප්‍රතිකාර ද්‍රව්‍ය පිළිබඳ ජපානයේ ගිෆෝ නගරයේ ඇති බයෝපති විශ්වවිද්‍යාලයේ දිනපතා පර්යේෂණ සිදු කරන බවත් ඇමෙරිකාව, මැලේසියාව, රුසියාව, වැනි රටවල පිහිටා ඇති බයෝපති රසායනාගාරවලද දිනපතා එවැනිම පර්යේෂණ සිදුකරන බවද ඇලන්ටන් වීරසිංහ මහතා අවධාරණය කර සිටී.

දිනෙන් දින අලුත්වන ලෝකයේ නව සොයාගැනීම් නව වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම බිහිවේ. බයෝපති ක්‍රමය අපට අලුත් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් වුවත් ජපානයේ එය දිගු ඉතිහාසයක් ඇති වෛද්‍ය ක්‍රමයක් බව වීරසිංහ මහතා සඳහන් කරයි.

මෙම බයෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව දැනගැනීමට යම් පුද්ගලයකුට අවශ්‍යනම් නො. 112/1 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ යන ලිපිනයෙන් හෝ දුරකථන 0777320898 අංකය මගින් ඇලන්ටන් වීරසිංහ මහතා විමසිය හැකියි.

## නිදන්ගත රෝග සුවකර ගැනීමට බයෝපති වෛද්‍ය ක්‍රමයෙන් උපදෙස්

# අපේ රටේ ඇදුම රෝගීන් ප්‍රවේශම් වෙනවා අඩුයි!

**ජපානයේ ප්‍රචලිත බයෝපති වෛද්‍ය ක්‍රමය දැන් ශ්‍රී ලංකාවේද ව්‍යාප්ත වෙමින් පවතියි. ලොව පුරා විවිධ රටවල් රැසක මේ ක්‍රමය ගෙවී ගිය වසර කීපය තුළ ව්‍යාප්ත වන්නට විය.**

පිළිකා, හෘද රෝග, අධි රුධිර පීඩනය, මොළේ ගෙඩි, අපස්මාරය, දියවැඩියාව, ආතරයිටිස්, තැලසීමියා ඇතුළු රෝග රාශියකට බයෝපති වෛද්‍ය ක්‍රමය මගින් සාර්ථකව ප්‍රතිකාර කළ හැකිය. ඒ අනුව අප රටේ ආරම්භ කෙරුනු මෙම ප්‍රතිකාර ක්‍රමයේදී භාවිතා කෙරෙනුයේ එම ප්‍රතිකාර ක්‍රමයට අදාළ ඖෂධ පමණක් වීම විශේෂත්වයක්.

ශ්‍රී ලංකාවට බයෝපති වෛද්‍ය ක්‍රමය හඳුන්වා දුන් බයෝපති වෛද්‍ය ඇලන්ටන් වීරසිංහ මහතා සමග ඇදුම රෝගය පිළිබඳව පසුගිය කලාපයේ කෙරුනු සාකච්ඡාවේ තවත් කොටසක් මේ.

**අපි ඇදුම කියා හඳුන්වන්නේ කෙබඳු රෝගයක්ද? මෙය ඉතා කෙටි කලකින් වුවද සෑදෙන්නට හැකි රෝගයක්ද?**

අපගේ ශ්වසන පද්ධතියට නාසය, කට, ශ්වාස නාලය, ස්වාස නාලිකා, පෙනහලු අයත් වෙනවා. පෙනහලුවලට ඔක්සිජන් වාතය රැගෙන ගොස් ඒවා අපිරිසුදුවුනු රුධිරයට එක්කොට රුධිරය පිරිසුදු කෙරෙනවා. මේ යන ගමනේදී අගින් සිහින්වුනු අනු ශ්වාස නාලිකා තුළින් වාතය ගමන් කිරීමේදී ඒවාට අවහිරතාවයක් ඇති වෙනවා. මේ තත්ත්වය තමයි "ඇදුම" නමින් හඳින් වෙන්නේ. මෙවිට ඇතිවන හුස්ම ගැනීමේ අපහසුතාවය නිසා රෝගියා අසහනයට පත් කෙරේ.


**"වීස් එක" යනුවෙන් සාමාන්‍ය භාවිතයේදී හැඳින්වෙන්නේ ඇදුම රෝගයමද?**

ඇදුම රෝගයට ඉංග්‍රිසියෙන් කියන්නේ ඇස්මා කියාය. වීස් එක යනුවෙන් හැඳින්වෙන්නේ මේ කාලයේ බහුලව දකින්නට ලැබෙන රෝගී තත්ත්වයක් වන පපුවේ හතියයි. පපුවේ හතියට නිසි ප්‍රතිකාරයක් නොමැතිව කලක් ගතවීම නිසා ඇදුම රෝගය වැළඳෙන්නට ඉඩ ඇත. පෙනහලුවලට වාතය ගෙන යනු ලබන ඉතා සියුම් ස්වාසනාලිකා පටුවීම නිසා හුස්ම ගැනීමේදී ශබ්දයක් ඇතිවීම සිදුවේ. හුස්ම ඉහළ පහළ ගැනීමේදී මේ හඬ නොනවත්වාම ඇතිවිය හැකියි. මේ හඬ මතුවූ පමණින් ඇදුම රෝගය වැළඳී ඇතැයි සිතිය නොහැකිය. සාමාන්‍ය පුද්ගලයෙකුට ඇදුම රෝගය වැළඳී තිබෙන බව බොහෝ දුරට කිව හැක්කේ හුස්ම ගන්නා වාරයක් සාමාන්‍ය තත්ත්වයෙන් සිටියදීට වඩා කෙටිවීම නිසාය. පපුවේ මහන්සිය, පපුවේ තද ගතිය, කැස්ස, සෙම ඇත්නම් ඇදුම රෝගය කෙටි කලකින් වුවද වැළඳෙන්නට හැකිය. ඇදුම නිසා ඇතිවන වියළි කැස්ස යමකුට රාත්‍රී කාලයට ඇතිවිය හැකිය. නොඑසේ නම් අළුයම් කාලයේදී ඇතිවිය හැකිය. සුදු හෝ කහ පාටින් යුත් සෙම කැටි වශයෙන් පිටවීම ඇදුම රෝගයේ තවත් ලක්ෂණයකි. "ඇදුම් රෝගය පිණිස ප්‍රතිකාර කරගෙන යන අතරේ පැයකින් දෙකකින් රෝගය සුවවුනා යැයි රෝගියාට දැනෙන්නට පුළුවන. ඇතැම් විට පැය ගණනකින්, දින ගණනකින් හෝ සති ගණනකින් රෝගය සුව වුනා යැයි දැනෙයි. නමුත් රෝගය නිට්ටාවට සුව කිරීම පහසු නොවේ."

*(මීළඟ කොටස ලබන කලාපයෙන් කියවන්න.)*

උපදෙස් –
බයෝපති වෛද්‍ය උපදේශක
**ඇලන්ටන් වීරසිංහ**
සටහන - **සෑම් පෙරේරා**

# රෝග රැසක් නිට්ටාවට සුවකරන




අපේ රටට එකතු වී ඇති නවතම වෛද්‍ය ක්‍රමය තමයි බයෝපති. ජපන් ජාතික මහාචාර්ය අකිරා ඔසාතෝ සොයාගත් බයෝපති ලංකාවට ගෙනාවේ බයෝපති උපදේශක වෛද්‍ය ඇලන්ටන් වීරසිංහයි.

බයෝපති මහාචාර්ය ඔසාතෝගේ නව යෙදුමකි. වචන දෙකක මූලික අර්ථය ගෙන කළ එකතුවක්. Bio (Greek Living Process, a mode of life) Patheia (Latin,Greek therapy,experience)

ප්‍රතිශක්තිකරණය (The Immune System) අපට උපතින්ම ලෙඩ රෝග හා සටන් කරන්න ලැබෙන මහත් දායාදයකි. නොයෙකුත් හේතු සාධක නිසා ප්‍රතිශක්තිකරණ ශක්තිය දුර්වල වූ විට ඇති වන ප්‍රතිඵලය තමයි රෝගී තත්ත්වයට පත්වීම. යම් යම් රෝග තත්ත්වවලට අනුව නොයෙක් විදියේ රෝග ලක්ෂණ (Symptoms) දකින්න පුළුවන. බයෝපති වෛද්‍ය ක්‍රමය මගින් කරන්නේ රෝග ලක්ෂණවලට පමණක් ප්‍රතිකාර කිරීම නොවෙයි. රෝගය ඇතිවීමට මූලික හේතුව මුලින් උපුටා දැමීමයි. (eradicate the root cause of the disease) තවත් විදියකින් සරලව කියනවා නම් දුර්වල වූ ප්‍රතිශක්තිකරණ ශක්තිය නැවත නන්වන ගමන් කිසියම් රෝගී තත්ත්වයකට හේතු වූ කාරණය සහමුලින්ම ඉවත් කිරීමයි.

මේ සඳහා බයෝපති වෛද්‍ය ක්‍රමයට පමණක් සීමා වූ ඖෂධ ඇත. ඒවා නිෂ්පාදනය කරන්නේ ජපානයේය. කිසිදු අස්වාභාවික දෙයක් අඩංගු නොවන බයෝපති ඖෂධවලින් කිසිදු අතුරු ආබාධ හෝ පසු ආබාධ ඇතිවීමක් නොවීම සුවිශේෂ ලක්ෂණයකි. ඒ වාගේම මේ ඖෂධ සියල්ල නිපදවන්නේ මහාචාර්ය ඔසාතෝ යටතේ ඇති පරීක්ෂණාගාරවල පරීක්ෂා කරමිනුයි. මුළු නිෂ්පාදන ක්‍රියාවලියට මහාචාර්ය ඔසාතෝගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ පවතී.

බයෝපති ලංකාවේ ආරම්භ කර ඉතාමත් කෙටි කාලයක් වුවත් මේ වන විට සුවය ලබාගෙන ඇති රෝගීන් සංඛ්‍යාව හා දැනට ප්‍රතිකාර ලබන සංඛ්‍යාව දෙස බලන විට ඉතා සතුටු විය හැකියි. විශේෂයෙන්ම මොළේ ගෙඩි හා අනෙකුත් ස්නායු සම්බන්ධිත රෝග (Brain tumors and other neurogical disorders) ඇදුම (Asthma) ගැස්ට්‍රයිටිස් (Gastritis), ආතරයිටිස් (Arthritis), අපස්මාරය (Epilepsy), තයිරොයිඩ් (Thyroid), දියවැඩියාව (Diabetes) යනාදිය සුව වී ඇති රෝගීන් මේ වන විටත් නැවත ඇතිවීමක් ගැන වාර්තා නොකිරීම ඉතා සතුටට කරුණකි. ජැපනීස් බයෝපති උපදේශක වෛද්‍යවරයා පැමිණෙන්නේ එකම තැනටයි. එනම් ස්ටැන්ලි තිලකරත්න මාවතේ ජැපනිස් බයෝපති මධ්‍යස්ථානයයි.

# නූතන වෛද්‍ය විද්‍යාවට යා යුතු මග හෙළිපෙහෙළි කරන බයෝපති වෛද්‍ය ක්‍රමය

ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්‍රම කිහිපයක් ඇත. බටහිර වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සහ දේශීය වෛද්‍ය ක්‍රමය ලෙස ඒවා නම් කළ හැකිය. මෑත කාලයේදී ශ්‍රී ලංකාවට තවත් අලුත් වෛද්‍ය ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ බයෝපති වෛද්‍ය ක්‍රමයයි. වාසනාවට බයෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාරවල තත්ත්වය අත්දැකීමට මට හැකියාවක් ලැබිණි.

මගේ බිරිඳ හදවත් රෝගියෙකි. හදවත් කපාටයක දෝෂයක් නිසා 1973 දීත්, 1993 දීත් වැල්වොටොමි සැත්කම්වලට භාජන කෙරිණි. එහෙත් 2004 වන විට නැවත හදවත් කපාට දෙකම අක්‍රිය වී ඉතා අසාධ්‍ය තත්ත්වයට පත් වූයෙන් කෘත්‍රිම කපාට දෙකක් බද්ධ කිරීමට සිදුවිය. සැත්කමෙන් පසු රුධිරගත සීනි ප්‍රමාණය පාලනය දුර්වල වුයෙන් ඉන්සියුලින් සහ තවත් පෙති වර්ග තුනක්ද හදවත් රෝගයට දිනපතා ජීවිතය තිබෙනතුරු තවත් පෙති වර්ග දහයක් ද දිය යුතුය. මේ ඖෂධ අතර රුධිරයේ දුස්ස්‍රාවීතාව හෙවත් ඝනත්වය පාලනය කරන ඖෂධ සුවිශේෂ වැදගත් කමකින් යුක්තය. එම ඖෂධ දෙන මාත්‍රාව වැඩි වුවහොත් අභ්‍යන්තර රුධිර වහනය සිදුවීමෙන් හෝ අඩු වුවහොත් කපාට දෙක සිරවී රුධිරය පොම්ප කිරීම නැවතීම නිසා හෝ රෝගියා මරණයට පවා පත්විය හැකිය. ඖෂධ රාශියක් සදාකාලිකවම ගැනීම නිසා වකුගඩු සහ අක්මාව ක්‍රියා විරහිත වීමේ අවදානමක් ද පවතින බව බටහිර වෛද්‍යවරුම පවසති.

තුන්වන හදවත් සැත්කමෙන් මාස තුනකට පමණ පසු ක්‍රමයෙන් හදවත් අමාරුව වැඩි වෙමින් රෝගියා නැවත හදවත් සැත්කමට පෙර සිටි අසාධ්‍ය තත්ත්වයටම පත්විය.

මේ අතර බයෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුව වූ රෝගියකුගේ ලිපියක් පුවත්පතක දැක නුගේගොඩ බයෝපති වෛද්‍ය ඇලන්වන් වීරසිංහ මහතාගෙන් රෝගියාට ප්‍රතිකාර ලබා දුනිමි. සති දෙකක් ගත වෙද්දී මහන්සි ගතිය ක්‍රමයෙන් අඩු වෙමින් හදවත් රෝගය සුව වීමේ ලක්ෂණ පෙන්නුම් කරන්නට විය. මාසයක' පමණ ගත වෙද්දී ගේ තුළ ඇවිද යෑමටත්, ඉවුම් පිහුම් වැඩ කටයුතුවල යෙදීමටත් හැකි විය. කලින් වාහනයකින් සුළු දුරක් ගමන් කළ විට අසාධ්‍ය තත්ත්වයට පත් වුවද මාස පහක් ප්‍රතිකාර ගැනීමෙන් පසු ඇයට සැතපුම් සිය ගණනක් වාහනයකින් ගමන් කළ හැකි විය. හදවත් රෝගය මෙන්ම දියවැඩියාව, බඩේ අම්ල ගතිය වැනි රෝගද සුව අතට හැරිණි.

බයෝපති ක්‍රමයෙන් ඇයට සම්පූර්ණ සුවය ලබා ගැනීමට නොහැකි වී තිබෙන්නේ ඇතැම් බටහිර ඖෂධ දීම අත්‍යවශ්‍ය නිසාය. කෙසේ වුවද අද අපහසුවකින් තොරව ජීවත් වන්නේ බයෝපති ඖෂධවලින් ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය සක්‍රීය වීම හේතුවෙනි.

අප ඉතා දියුණු මට්ටමක පවතින බටහිර වෛද්‍ය ක්‍රමය ප්‍රතික්ෂේප කළ යුතු නැත. එය රෝග විනිශ්චයේදී සහ හදිසි ප්‍රතිකාර ක්‍රමවලදී ඉතා දියුණු තත්ත්වයක පවතී. අප ඒවායින් ප්‍රයෝජන ගත යුතුය. එය බටහිර වෛද්‍ය ක්‍රමයේ පමණක් පවතින සුවිශේෂතාවයකි.

ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී රෝගියාගේ භෞතික, කායික විද්‍යාත්මක, මානසික, පාරිසරික සහ සමාජයික යන ඕනෑම ක්ෂේත්‍රයක වෙනස්වීමක් නිසා රෝගයක් හටගත හැකි බව සැලකිල්ලට ගෙන රෝගියාට ඖෂධ ලබා දේ. භාවිත කරන ශාක සාර සහ සත්වසාර ඖෂධ බටහිර ඖෂධ මෙන් සංශුද්ධ කෘත්‍රිම රසායන ද්‍රව්‍ය නොවේ. ඒවා විවිධ ස්වාභාවික ද්‍රව්‍යවල මිශ්‍රණයකි. එබැවින් අතුරු ආබාධ ඇති වන්නේ නැත.

ජනමාධ්‍ය ඔස්සේ අනාවරණය වූ පරිදි බයෝපති වෛද්‍ය ක්‍රමය ද නවීන විද්‍යාත්මක ක්‍රම භාවිත කොට විවිධ වෛද්‍ය පර්යේෂණ ඔස්සේ දියුණු තත්ත්වයට පත් කරන ලද ජපන් ජාතික බටහිර විශේෂඥ වෛද්‍යවරයකු විසින් හඳුන්වා දී ඇති වෛද්‍ය ක්‍රමයකි. මෙහිදී ඖෂධ වශයෙන් භාවිත කරන්නේ ශාකවලින් නිස්සාරණය කරගත් සංයෝගයකි. එම සංයෝගය මගින් මිනිසාගේ රෝගවලට ඔරොත්තු දීම ඇති කරන ප්‍රතිදේහ නිපදවන පද්ධතිය සක්‍රිය කර ප්‍රතිදේහ නිපදවීම උත්තේජනය කරයි. මේ, නිසා බොහෝමයක් දරුණු රෝග තත්ත්වයන් පවා සුව වේ. මෙම ඖෂධ භාවිතයේදී රසායනික ඖෂධ භාවිතයේදී මෙන් රෝගියාට අතුරු ආබාධ ඇති නොවේ. එක් රෝගයකට ප්‍රතිකාර කරන විට ශරීරයේ අනෙක් රෝග ද සුවපත් වේ. ශරීරය වෙනත් රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ද වැඩි දියුණු වේ.

ආරෝග්‍යශාලාවකට එන රෝගීන්ගෙන් වැඩි දෙනෙක් දේශීය වෛද්‍ය ක්‍රමය මගින් හෝ විශේෂයෙන් බයෝපති වෛද්‍ය ක්‍රමය මගින් සුවපත් කළ හැකි රෝගීන් බව බයෝපති ප්‍රතිකාර ගන්නා කාලය තුළ පැමිණ සිටි විවිධ අසාධ්‍ය රෝගීන් සමග කතා කිරීමේදී මට වැටහිණි. ඒ අතර මාගේ රෝගියා මෙන්ම එනෙක් අනෙක් වෛද්‍ය ක්‍රම මගින් සාර්ථක ප්‍රතිකර්ම නොලැබූ මරණයෙන් පවා ගැලවුණු රෝගීන්ද බොහෝමයක් සිටි බව සටහන් කිරීම බොහෝ දෙනාගේ දැන ගැනීම සඳහා වැදගත් වේ. විශේෂයෙන්ම අනාගතයේ විවිධ වකවානුවල ශල්‍ය කර්මයන්ට නිර්දේශිත මට්ටමේ හෘද රෝග, වකුගඩු රෝග, මොළයේ ගෙඩි වැනි රෝගවලට ප්‍රතිකාර ගන්නා අයට ප්‍රතිකාර කරගෙන යන අතර තුර බටහිර වෛද්‍ය ක්‍රමයේ නිර්දේශිත සුදුසු වෛද්‍ය වාර්තාවන් ලබාගෙන රෝගියාගේ සුවවීමේ ප්‍රවණතාව වුවද නිශ්චය කරගත හැකි තත්ත්වයක් මෙහි පවතිනවා ය යන්න සටහන් කර තැබීම අතිශයෝක්තියක් නොවේ. එමෙන්ම වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැළි විවිධ වෘත්තිකයන්ගේ පවුල්වල රෝගීන් පවා බයෝපති ප්‍රතිකාර ගන්නා රෝගීන් අතර සිටීම ප්‍රතිකාර සඳහා යොමු වී ඇති අප වැනි සාමාන්‍ය අයට මහත් අස්වැසිල්ලකි.

විකල්ප වෛද්‍ය ක්‍රම කෙරෙහි බොහෝ බටහිර රටවල් ශීඝ්‍රයෙන් යොමුවන මෙවන් අවධියක බයෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවට අතිශයින්ම යෝග්‍ය විකල්පයක් වනු ඇතැයි මම සිතමි.

නූතන විද්‍යාව විවිධ නිම්වළලු ඔස්සේ නිර්මාණශීලීව ඉදිරියට යයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිශය භයංකර සෞඛ්‍ය විද්‍යාත්මක අතුරු ඵල ජනිත කර ඇත. එවැනි රෝගවලට විවිධ රසායනික සංයුතීන්ගෙන් යුත් දහස් ගණන් ඖෂධ නිපදවති. එම ඖෂධ මගින් රෝග සුව නොවන අතර ඒවායින් බොහෝ අතුරු ආබාධ/රෝගී තත්ත්වයන් ඇතිවේ. මෑත අඩ සියවසක කාලයක් තිස්සේ නූතන වෛද්‍ය විද්‍යාව ඔප්පු කර ඇත්තේ එම කටුක යථාර්ථයයි.

කුමන අහිතකර තත්ත්වයන් යටතේ වුවද මිනිස් සිරුරේ ස්වාභාවික ඔරොත්තු දීමේ හැකියාව පමණක් වර්ධනය කළහොත් මිනිසුන්ට යම්තාක් දුරට හෝ නිරෝගීව සිටිය නොහැකිද? මට හැඟෙන විදියට බයෝපති වෛද්‍ය ක්‍රමය පිළිතුරු සපයන්නේ මෙම ප්‍රශ්නයටයි. එය මෑත භාගයේදී නූතන වෛද්‍ය විද්‍යාවේ ගමන් මග උඩු යටිකුරු කළ විශ්මිත ප්‍රයත්නයකි. විවිධ රෝගවලට නොයෙක් ආකාරයේ ඖෂධ සොයනු වෙනුවට ලෙඩවීමට ප්‍රධානම හේතුව මිනිසාගේ ස්වාභාවික ප්‍රතිශක්තිය හීන වීම වළකා ශරීරයේ ස්වාභාවික ප්‍රතිශක්තිය නංවාලීමම ප්‍රමාණවත් බව බයෝපති වෛද්‍යක්‍රමයෙන් තහවුරු වේ. මෙය වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැළි පර්යේෂකයන්ට යා යුතු නිසි ගමන් මග කියා දීමකි. එය නූතන බටහිර විශේෂඥ වෛද්‍යවරයකු විසින්ම පෙන්වා දීමත් ඒ සඳහා සුදුසු ස්වාභාවික ඖෂධ ඔහු අතින්ම නිෂ්පාදනය වීමත් එතුළින් බයෝපති නමින් නව වෛද්‍ය ක්‍රමයක් ප්‍රකාශයට පත් කිරීමත්, අතිශය වැදගත් වූ ඓතිහාසික සිදුවීමකි.

සෑම වෛද්‍ය ක්‍රමයකම ඒවාට ආවේණික රෝග සුව කිරීමේ හැකියාවන් පවතී. මෙම සුවිශේෂ හැකියාවන් කෙරෙහි ගරු කිරීමට සෑම වෛද්‍ය ක්‍රමයකම වෛද්‍යවරු මැලි විය යුතු නොවේ. එයට හේතුව ඒ සුවිශේෂතාව පවතින්නේ ඒ වෛද්‍ය ක්‍රමයට පමණක් වීමයි. නිදසුන් වශයෙන් ගතහොත් බටහිර වෛද්‍යවරයකු වුවද අතක් පයක් කැඩුණු විට එය නිසි ලෙස සුවකර ගැනීමට යන්නේ දේශීය වෛද්‍යවරයකු වෙතටයි. එබැවින් විවිධ වෛද්‍ය ක්‍රම අතර මනා සම්බන්ධීකරණයක් ඇති කර ඒවායේ හොඳ ගති ලක්ෂණ එක්තැන් කර රෝගියා මූලික වූ ප්‍රතිකාර ක්‍රමයක් ඇති කිරීම යුගයේ අවශ්‍යතාවක් වී තිබේ. අඩුම වශයෙන් ප්‍රධාන රෝහල් ආශ්‍රිතවත් බටහිර වෛද්‍ය ක්‍රමය දේශීය වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සහ බයෝපති වෛද්‍ය ක්‍රමය ඇතුළත් ප්‍රතිකාර මධ්‍යස්ථාන පර්යේෂණ මට්ටමෙන්වත් ඇති කිරීම කාලෝචිත පියවරකි. එහිදී වෛද්‍යක්‍රම සියල්ලෙහිම උපරිම ශක්තිය ප්‍රයෝජනයට ගෙන බොහෝ අසාධ්‍ය මට්ටමේ පසුවන රෝගීන් වුවද සුවපත් කළ හැකිය. මා මෙසේ පවසන්නේ තුන්කල් බලා තීරණ ගත හැකි දේශපාලඥයන් අතලොස්සක් හෝ අප අතර සිටින බව මේ දිනවල පෙනෙන්නට තිබෙන බැවිනි.

විවිධ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම අතර මෙවැනි මනා සම්බන්ධීකරණයක් ඇති කළහොත් සෞඛ්‍යය වෙනුවෙන් වැය කරන මහා ධනස්කන්ධයෙන් ජනතාවට උපරිම ප්‍රයෝජන ගත හැකි වනු ඇත. එමෙන්ම සැත්කම් සඳහා පිටරටවලට ඇදියන, කෝටි ගණනක් මුදල් ප්‍රමාණයද අඩුකර ගත හැකි වේ. මෙසේ වසරකට අපතේ යන ඉතා විශාල වූ ධනස්කන්ධය නවතා ඇම්මට කළයුතු වන්නේ ඉතාමත්ම සරල කාර්යයකි. එනම් සෑම වෛද්‍යක්‍රමයක පවතින සුවිශේෂතාව පිළිගෙන වෛද්‍යවරු එකට අත්වැල් බැඳගැනීම පමණි. මහජන මුදල්වලින් වෛද්‍ය වෘත්තියට ඇතුළත් වූ උගත් බුද්ධිමත් පිරිසකට මෙය ඉතාමත් පහසු කටයුත්තක් බව මගේ හැඟීමයි.

'අංජන' මනතුංග මාවත,
හෝමාගම.
ජේ. ඩී. කොතලාවල

# නිම්නය

# බටහිර වෛද්‍ය ක්‍රමය, දේශීය වෛද්‍ය ක්‍රමය සහ බයෝපති වෛද්‍ය ක්‍රමය

අද ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්‍රම කිහිපයක් ඇත. බටහිර වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සහ දේශීය වෛද්‍ය ක්‍රමය ලෙස ඒවා නම් කළ හැක. මෑත කාලයේදී ශ්‍රී ලංකාවට තවත් අලුත් වෛද්‍ය ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ බයෝපති වෛද්‍ය ක්‍රමයයි. වාසනාවකට බයෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාරවල තත්ත්වය අත්දැකීමට මට හැකියාවක් ලැබිණි.

බටහිර වෛද්‍ය විද්‍යාවේදී ශරීරයේ කුඩා කොටස් වෙත අවධානය යොමු කරනවා මිස රෝගියා සමස්තයක් වශයෙන් ගෙන සලකා බලන්නේ නැත. එබැවින් ඔවුන් රෝගයක් දකින්නේ විශාල යන්ත්‍රයක කුඩා කොටසක සිදුවූ දෝෂයක් ලෙසයි. කෘත්‍රිමව නිපදවූ විවිධ රසායනික ද්‍රව්‍ය ඖෂධ ලෙස දීම නිසා තාවකාලික වශයෙන් රෝගය සුව වූවා සේ පෙනුනද, ශරීර අභ්‍යන්තරයේ රසායනික තුලිතතාව වෙනස් වීම හේතු කොටගෙන විවිධ අතුරු ආබාධ හටගනී.

ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී රෝගියාගේ භෞතික, කායික විද්‍යාත්මක, මානසික, පාරිසරික සහ සාමාජයික යන ඕනෑම ක්ෂේත්‍රයක වෙනස් වීමක් නිසා රෝගයක් හටගත හැකි බව සැලකිල්ලට ගෙන රෝගියාට ඖෂධ ලබා දේ. භාවිත වන ශාකසාර සහ සත්වසාර බටහිර ඖෂධ මෙන් සංශුද්ධ කෘත්‍රිම රසායන ද්‍රව්‍ය නොවේ. ඒවා විවිධ ස්වාභාවික ද්‍රව්‍යවල මිශ්‍රණයකි. එබැවින් අතුරු ආබාධ ඇතිවන්නේ නැත.

ජනමාධ්‍ය ඔස්සේ අනාවරණය වූ පරිදි බයෝපති වෛද්‍ය ක්‍රමය ද නවීන විද්‍යාත්මක ක්‍රම භාවිත [illegible] පර්යේෂණ ඔස්සේ දියුණු තත්ත්වයට පත් කරන ලද ජපන් ජාතික බටහිර විශේෂඥ වෛද්‍යවරයකු විසින් හඳුන්වා දී ඇති වෛද්‍ය ක්‍රමයකි. මෙහිදී ඖෂධ වශයෙන් භාවිත කරන්නේ පැපොල් ශාකයෙන් නිස්සාරණය කරගත් සංයෝගයකි. එම සංයෝගය මගින් මිනිසාගේ රෝගවලට ඔරොත්තු දීම ඇති කරන ප්‍රතිදේහ නිපදවන පද්ධතිය සක්‍රීය කර ප්‍රතිදේහ නිපදවීම ...ත්තේජනය ක... මේ නිසා බොහෝමයක් රෝග සුව වේ. මෙම ඖෂධ භාවිතයේදී රසායනික ඖෂධ භාවිතයේදී මෙන් රෝගියාට අතුරු ආබාධ ඇති නොවේ. එක් රෝගයකට වෙදකම් කරන විට ශරීරයේ අනෙක් රෝග ද සුවපත් වේ. වෙනත් රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ද වැඩි දියුණු වේ.

මගේ බිරිඳ හදවත් රෝගියෙකි. හදවත් කපාටයක දෝෂයක් නිසා 1973 දීත්, 1993 දීත් වැල්වොටොමි සැත්කම්වලට භාජන කෙරිණි. එහෙත් 2004 වන විට නැවත හදවත් කපාට දෙකම අක්‍රිය වී ඉතා අසාධ්‍ය තත්ත්වයට පත් වූයෙන් කෘත්‍රිම කපාට 2 ක් බද්ධ කිරීමට සිදු විය. සැත්කමෙන් පසු රුධිරගත සීනි ප්‍රමාණය පාලනය දුර්වල වූයෙන් ඉන්සියුලින් සහ තවත් පෙති වර්ග තුනක් ද හදවත් රෝගයට දිනපතා ජීවිතය තිබෙන තුරු තවත් පෙති වර්ග දහයක් දිය යුතුය. මේ ඖෂධය අතර රුධිරයේ දුස්ස්‍රාවිතාව හෙවත් ඝණත්වය පාලනය කරන ඖෂධ සුවිශේෂ වැදගත්කමකින් යුක්තය. එම ඖෂධ දෙන මාත්‍රාව වැඩි වුවහොත් අභ්‍යන්තර රුධිර වහනය සිදුවීමෙන් හෝ අඩු වුවහොත් කපාට දෙක සිර වී රුධිර පොම්ප කිරීම නැවතීම නිසා රෝගියා මරණයට පවා පත්විය හැක. ඖෂධ රාශියක් සදාකාලිකවම ගැනීම නිසා වකුගඩුව, අක්මාව ක්‍රියා විරහිත වීමේ අවදානම ද පවතී.

හදවත් සැත්කමෙන් මාස තුනකින් පමණ පසු ක්‍රමයෙන් හදවත් අමාරුව වැඩි වෙමින් රෝගියා ක්‍රමයෙන් හදවත් සැත්කමට පෙර සිටි අසාධ්‍ය තත්ත්වයටම පත්විය.

[illegible] අතර බයෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුව වූ රෝගියකුගේ ලිපියක් පුවත්පතක දැක නුගේගොඩ බයෝපති වෛද්‍ය ඇලන්ටන් වීරසිංහ මහතාගෙන් හදවත් රෝගියාට ප්‍රතිකාර ලබා දුනිමි. සති දෙකක් ගත ...ද්දී මහන්සි ගතිය ක්‍රමයෙන් අඩුවෙමින් හදවත් රෝගය සුවවීමේ ලක්ෂණ පෙන්නුම් කරන්නට විය. මාසයක් පමණ ගතවෙද්දී ...ගේ ඉළ ඇවිද යෑමටත්, ඉවුම් පිහුම් වැඩ කටයුතුවල යෙදීමටත් හැකි විය. කලින් වාහනයකින් සුළු දුරක් ගමන් කළ ද අසාධ්‍ය තත්ත්වයට පත් වුවද මාස 5 ක් ප්‍රතිකාර ගැනීමෙන් පසු ඇයට සැතපුම් සිය ගණනක් වාහනයකින් ගමන් කළ හැකි විය. හදවත් රෝගය මෙන්ම දියවැඩියාව, බඩේ අම්ල ගතිය වැනි රෝග ද සුව අතට හැරුණි.

ඇයට සම්පූර්ණ සුවය ලබා ගැනීමට නොහැකි වී තිබෙන්නේ ඇතැම් බටහිර ඖෂධ දීම අත්‍යවශ්‍ය නිසාය. කෙසේ වුවද අද අපහසුවකින් තොරව ජීවත් වන්නේ බයෝපති ඖෂධවලින් ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය සක්‍රීය වීම හේතුවෙනි.

අප ඉතා දියුණු මට්ටමක පවතින බටහිර වෛද්‍ය ක්‍රමය ප්‍රතික්ෂේප කළ යුතු නැත. එය රෝග විනිශ්චයේදී සහ හදිසි ප්‍රතිකාර ක්‍රමවලදී ඉතා දියුණු තත්ත්වයක පවතී. අප ඒවායින් ප්‍රයෝජන ගත යුතුය.

අද ආරෝග්‍යශාලාවකට එන රෝගීන්ගෙන් වැඩිදෙනෙක් හා දේශීය වෛද්‍ය ක්‍රමය මගින් හෝ විශේෂයෙන් බයෝපති වෛද්‍ය ක්‍රමය මගින් සුවපත් කළ හැකි රෝගීන් බව බයෝපති ප්‍රතිකාර ගන්නා කාලය තුළ පැමිණ සිටි විවිධ අසාධ්‍ය රෝගීන් සමග කතා කිරීමේදී මට වැටුහිණි. ඒ අතර මගේ රෝගියා මෙන්ම එතෙක් අනෙක් වෛද්‍ය ක්‍රම මගින් සාර්ථක ප්‍රතිකර්ම නොලැබූ මරණයෙන් පවා ගැලවුණු රෝගීන් ද බොහොමයක් සිටි බව සටහන් කිරීම බොහෝ දෙනාගේ දැන ගැනීම සඳහා වැදගත් වේ.

එබැවින් සියලුම වෛද්‍ය ක්‍රම අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා 'රෝගියා මූලිකව ම වැදගත් පුද්ගලයා ය' යන සංකල්පය මත පිහිටා ප්‍රතිකාර කිරීමෙ සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සැකසීමට දේශපාලකයන්ගේ හා වෛද්‍ය වෘත්තිකයන්ගේ ද අවධානය යොමුවිය යුතුය.

මේ සඳහා සංවාදයක් දු. ඇ. 2855129 හෝ 'අංජන' මනතුංග මාවත, හෝමාගම යන ලිපිනයෙන්ද විමසිය හැක.

***ඒ. බී. කොතලාවල***
*(B. Sc. Mphil)*

# මොළයේ ගෙඩියකට කළ බයෝපති ප්‍රතිකාර පිළිබඳව අපගේ අත්දැකීම්

මෑතකදී ඔබ පුවත්පතේ කෘත්‍රිම කපාට බද්ධ කරන ලද හෘද රෝගියකුට කරන ලද බයෝපති ප්‍රතිකාර පිළිබඳව වූ ලිපිය කියවීමෙන් අනතුරුව මොළයේ ගෙඩියක් සඳහා කරන ලද බයෝපති ප්‍රතිකාරවල තොරතුරු ලියා එවීමට අදහස් කළෙමි.

මාගේ බිරිඳගේ පියා කාලයක් තිස්සේ වින්ද තදබල හිසේ වේදනාව, ඇවිදීමට අපහසුවීම, ඇස් පෙනීම දුර්වල වීම ආදියට කළ ප්‍රතිකාරවලින් අනතුරුව හදිසි රෝගී තත්ත්වයක් උද්ගත වීම නිසා කොළඹ මහ රෝහලට ඇතුළත් කරන ලදී. රෝහල් ගත කරන අවස්ථාවේ දී තදබල හිසේ වේදනාවක්ද, ඇස් පිහාටු අක්‍රියව, සිහිසුන්ව සම්පූර්ණ ශරීරයම අංශභාග රෝගියකුගේ රෝග ලක්ෂණ මෙන් අක්‍රියව පැවතුණි. සති කිපයක් තිස්සේ කළ විවිධ වෛද්‍ය පරීක්ෂණවලින් අනතුරුව මොළයේ ගෙඩියක් පවතින බවත්, ශල්‍යකර්මයකින් ලෙඩා ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒම කෙසේ වෙතත් ප්‍රකෘති සිහිය ලබා ගැනීමටවත් හැකි වේදැයි යන්න ඉතාමත් අවිනිශ්චිත බවත් ප්‍රකාශ විය. කළ හැකි වෙනත් දෙයක් නොවූ බැවින් ශල්‍යකර්මයක් කිරීමට අප සම්පූර්ණ එකඟතාව ප්‍රකාශ කළ ද, නිර්වින්දන වෛද්‍යවරයා නිර්වින්දනය කිරීම ප්‍රතික්ෂේප කළ බැවින් ශල්‍යකර්මයක් කළ නොහැකි බවත් ලෙඩාගේ ජීවිත කාලය සති කිහිපයකට වඩා නොපවතින බවත් පවසා ඔහුව ගෙදර ගෙන යන ලෙස උපදෙස් ලැබුණි. මේ වන විට මාස එකහමාරක කාලයක් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා තිබුණි.

පසුගිය දිනක පුවත්පතට (2004 දෙසැම්බර් මස) මොළයේ ගෙඩියක් සඳහා බයෝපති ප්‍රතිකාර ලබා අපස්මාරයෙන් සහනය ලැබූ රෝගියෙක් අනෙක් අය දැනුවත් කිරීම සඳහා පළ කරන ලද පුද්ගලික දැන්වීමක් අහම්බෙන් කියවන්නට ලැබුණි. ඔහු ලබා දුන් 077-320898 දරන බයෝපති මධ්‍යස්ථානයේ දුරකථනයට කතා කොට ලෙඩා බයෝපති වෛද්‍ය ඇලන්ටන් වීරසිංහ මහතා වෙත ගෙන ගියෙමි. ඒ අවස්ථාව වන විට අප සතුව තිබූ වෛද්‍ය පරීක්ෂණ වාර්තා සහ රෝහලේ ප්‍රතිකාර කාඩ්පත් අධ්‍යයනය කර වහාම බයෝපති ප්‍රතිකාර ආරම්භ කෙරිණි. එහිදී "ලෙඩා පිළිබඳව බිය විය යුතු නැතැයි" වෛද්‍යවරයා විසින් කරන ලද ප්‍රකාශය පවුලේ උදවියට මහත් අස්වැසිල්ලක් මෙන්ම ධෛර්යයක් ද විය. සතියක් අවසාන වන විට අක්‍රියව තිබූ ඇස් පිහාටු යාන්තම් සෙලවීමට පටන් ගත් අතර සති දෙකක් යන විට ඇස් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීමටත්, තදබල හිසරදය පහව ගොස් ආහාර ගැනීමත්, ප්‍රකෘති සිහියත් සැලකිය යුතු මට්ටමකට වර්ධනය විය. මාස දෙකක් අවසන් වන විට ලෙඩාගෙන් රෝගී තත්ත්වයක් විද්‍යමාන නොවන මට්ටමකට පරිවර්තනය විය. මාස හයකට ආසන්න කාලයක් ප්‍රතිකාර කිරීමෙන් අනතුරුව කරන ලද වෛද්‍ය පරීක්ෂණය අධ්‍යයනය කර විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රකාශ කළේ ඔහු සම්පූර්ණ සුවය ලබා ඇති බවයි. මේ අතර බටහිර විශේෂඥ වෛද්‍යවරයකු වූ බයෝපති වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ මහාචාර්ය අකිරා ඔසානෝ ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ දී එතෙක් බයෝපති ප්‍රතිකාර ලබා සුව වූ දරුණු රෝග තත්ත්වයන්ට මුහුණ දී සිටි අයට මහාචාර්යවරයා හමුවීමට දී තිබූ අවස්ථාවේ මාගේ මාමා ද ඔහුට පෙන්වීමි. ඔහු ද ප්‍රකාශ කළේ රෝගී තත්ත්වය සම්පූර්ණයෙන් සුව වී ඇති බවයි. එහිදී බයෝපති ප්‍රතිකාරවලින් සම්පූර්ණ සුවය ලබා සිටි මොළයේ ගෙඩි, ආතරයිටිස්, අධික රුධිර පීඩනය, දියවැඩියාව, ඇදුම, වකුගඩු, ස්නායුරෝග වැනි විවිධ දරුණු රෝග සෑදී තිබූ අය සමග කතා කිරීමේ අවස්ථාවක් මට ද ලැබුණි. එහි දී මා උද්දාමයට පත් වූ විශේෂ කරුණක් විය. එනම් මගේ මාමා සුවවීමෙන් අනතුරුව ඉරිදා පුවත්පතකට මා විසින් ලියූ මෙවැනිම ලිපියක් කියවා ප්‍රතිකාර සඳහා යොමු වූ රෝගීන් අතර මොළයේ ගෙඩි සම්පූර්ණයෙන් සුවකර ගත් අයද වීමය. ඔවුන් අතර ශල්‍යකර්මවලට මුහුණ දුන් හා නොදුන් අය ද එවීම ඉතාමත් වැදගත් කරුණකි.

සම්පූර්ණ සුවය ලැබීමෙන් අනතුරුව වසර දෙකකට ආසන්න කාලයක් සුපුරුදු කෘෂිකර්ම වැඩවල කය වෙහෙසා වැඩ කරන ඔහු අද නිරෝගී සාමාන්‍ය පුද්ගලයෙකි. මගේ මාමා රෝහලේ ගත කළ කාලය තුළ මෙම රෝගය සෑදුනු බොහෝ රෝගීන් ශාරීරිකව විඳින වද වේදනා පිළිබඳ සැබෑ තත්ත්වය මට දැනගත හැකි විය. එහෙත් මරණාසන්න රෝගී තත්ත්වයක සිට ඉතාමත් කෙටි කාලයකින් සම්පූර්ණ නිරෝගී තත්ත්වයක් කරා පැමිණීම කෙනෙකුට විස්තර කර දීමට පවා ඉතාමත් අපහසු කරුණකි. එසේම වෙනත් රෝගීන් මෙන් මුළු ජීවිත කාලයම බෙහෙත් මත යැපීම හා ශාරීරික වද වේදනාවලින් මිදීම ඔහු ලද භාග්‍යයකි. බයෝපති ප්‍රතිකාර පිළිබඳව සමාජය දැනුවත් කිරීම මගින් තවත් රෝගීන් කිහිප දෙනෙකුගේ හෝ දිවි ගලවා ගැනීමට අවස්ථාව සැලසුනහොත් මා ලබන ආත්ම තෘප්තිය වචනවලින් කිව නොහැකි බව මගේ හැඟීමයි.

පී. ඩී. ධම්මික, 107/1, ඇඹාදොළ පාර, මාදලාව, පාදුක්ක

# මොළයේ ගෙඩිවලට

# බයෝපති ප්‍රතිකාර

මෑතකදී ඔබ පුවත් පතට කෘත්‍රිම කපාට බද්ද කරන ලද හෘද රෝගියෙකුට කරන ලද බයෝපති ප්‍රතිකාර පිළිබඳව වූ ලිපිය කියවීමෙන් අනතුරුව මොළයේ ගෙඩියක් සඳහා කරන ලද බයෝපති ප්‍රතිකාරවල තොරතුරු ලියා එවීමට අදහස් කළෙමි.

මාගේ බිරිඳගේ පියා කාලයක් තිස්සේ වින්ද තදබල හිසේ වේදනාව, ඇවිදීමට අපහසුවීම, ඇස් පෙනීම දුර්වලවීම ආදියට කළ ප්‍රතිකාරවලින් අනතුරුව හදිසි රෝගී තත්ත්වයක් උද්ගතවීම නිසා කොළඹ මහ රෝහලට ඇතුළත් කරන ලදී. රෝහල් ගත කරන අවස්ථාවේදී තදබල හිසේ වේදනාවක්ද, ඇස් පිහාටු අක්‍රියව, සිහිසුන්ව සම්පූර්ණ ශරීරයම අංශභාග රෝගියෙකුගේ රෝග ලක්ෂණ මෙන් අක්‍රියව පැවතුනි. සති කීපයක් තිස්සේ කළ විවිධ වෛද්‍ය පරීක්ෂණ වලින් අනතුරුව මොළයේ ගෙඩියක් පවතින බවත් ශල්‍ය කර්මයකින් ලෙඩා ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒම කෙසේ වෙතත් ප්‍රකෘති සිහිය ලබා ගැනීමටවත් හැකිවේදැයි යන්න ඉතාමත් අවිනිශ්චිත බවත් ප්‍රකාශ විය. කළ හැකි වෙනත් දෙයක් නොවූ බැවින් ශල්‍ය කර්මයක් කිරීමට අප සම්පූර්ණ එකඟතාවය ප්‍රකාශ කළද, නිර්වින්දන වෛද්‍යවරයා නිර්වින්දනය කිරීම ප්‍රතික්ෂේප කළ බැවින් ශල්‍ය කර්මයක් කළ නොහැකි බවත් ලෙඩාගේ ජීවිත කාලය සති කිහිපයකට වඩා නොපවතින බවත් පවසා ඔහුව ගෙදර ගෙන යන ලෙස උපදෙස් ලැබිණි. මේ වන විට මාස එකහමාරක කාලයක් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර කර තිබිණි.

මේ දිනවල ඉරිදා දිවයින පුවත් පතකට (2004 දෙසැම්බර් මස) මොළයේ ගෙඩියක් සඳහා බයෝපති ප්‍රතිකාර ලබා අපස්මාරයෙන් සහනය ලැබූ රෝගියෙක් අනෙක් අය දැනුවත් කිරීම සඳහා පළකරන ලද පුද්ගලික දැන්වීමක් අනුමෙන් කියවන්නට ලැබිණි. ඔහු ලබා දුන් 0777 320898 දරන බයෝපති මධ්‍යස්ථානයේ දුරකථනයට කථා කොට ලෙඩා බයෝපති වෛද්‍ය ඇලන්ටන් වීරසිංහ මහතා වෙත ගෙන ගියෙමි. ඒ අවස්ථාව වන විට අප සතුව තිබූ වෛද්‍ය පරීක්ෂණ වාර්තාව සහ රෝහලේ ප්‍රතිකාර කාඩ්පත අධ්‍යයනය කර වහාම බයෝපති ප්‍රතිකාර ආරම්භ කෙරිණි. එහිදී ලෙඩා පිළිබඳව බිය විය යුතු නැතැයි වෛද්‍යවරයා විසින් කරන ලද ප්‍රකාශය පවුලේ උදවියට මහත් අස්වැසිල්ලක් මෙන්ම ධෛර්යයක් ද විය. සතියක් අවසාන වන විට අක්‍රියව තිබූ ඇස් පිහාටු යාන්තම් සෙලවීමට පටන් ගත් අතර සති දෙකක් යන විට ඇස් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීමටත් තදබල හිසරදය පහව ගොස් ආහාර ගැනීමත් ප්‍රකෘති සිහියත් සැලකිය යුතු මට්ටමකට වර්ධනය විය. මාස දෙකක් අවසන් වන විට ලෙඩාගෙන් රෝගී තත්ත්වයක් විද්‍යාමාන නොවන මට්ටමකට පරිවර්තනය විය.

මාස හයකට ආසන්න කාලයක් ප්‍රතිකාර කිරීමෙන් අනතුරුව කරන ලද වෛද්‍ය පරීක්ෂණ අධ්‍යයනය කර විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රකාශ කළේ ඔහු සම්පූර්ණ සුවය ලබා ඇති බවයි. මේ අතර බටහිර විශේෂඥ වෛද්‍යවරයකු වූ බයෝපති වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ මහාචාර්ය අකිරා ඔසාතෝ ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී එතෙක් බයෝපති ප්‍රතිකාර ලබා සුව වූ දරුණු රෝග තත්ත්වයන්ට මුහුණ දී සිටි අයට මහාචාර්යවරයා හමුවීමට දී තිබූ අවස්ථාවේ මගේ මාමාද ඔහුට පෙන්විය. ඔහුද ප්‍රකාශ කළේ රෝගී තත්ත්වය සම්පූර්ණයෙන්ම සුව වී ඇති බවයි.

සම්පූර්ණ සුවය ලැබීමෙන් අනතුරුව වසර දෙකකට ආසන්න කාලයක් සුපුරුදු කෘෂිකර්ම වැඩවල කය වෙහෙසා වැඩ කරන ඔහු අද නිරෝගී සාමාන්‍ය පුද්ගලයෙකි. මගේ මාමා රෝහලේ ගතකළ කාලය තුළ මෙම රෝගය සෑදුණු බොහෝ රෝගීන් ශාරීරිකව විඳින වද වේදනා පිළිබඳ සැබෑ තත්ත්වය මට දැනගත හැකිවිය. එහෙත් මරණාසන්න රෝගී තත්ත්වයක සිට ඉතාමත් කෙටි කාලයකින් සම්පූර්ණ නිරෝගී තත්ත්වයක් කරා පැමිණීම කෙනෙකුට විස්තර කර දීමට පවා ඉතාමත් අපහසු කරුණකි. එසේම වෙනත් රෝගීන් මෙන්ම මුළු ජීවිත කාලයම බෙහෙත් මත යැපීම් හා ශාරීරික වද වේදනාවලින් මිදීම ඔහු ලද භාග්‍යයකි. බයෝපති ප්‍රතිකාර පිළිබඳව සමාජය දැනුවත් කිරීම මගින් තවත් රෝගීන් කිහිප දෙනෙකුගේ හෝ දිවි ගලවා ගැනීමට අවස්ථාව සැලසුනහොත් මා ලබන ආත්ම තෘප්තිය වචන වලින් කිව නොහැකි බව මගේ

